" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுதொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/30-38/FI/2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2024.04. 24

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කම්වු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2024.04.09 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | චක්‍රලේඛ අංකය | චක්‍රලේඛය නිකුත් කළ දිනය | විස්තරය |
|---|---|---|---|
| 01 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2024 | 2024.02.27 | රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යාන්ත්‍රණය හඳුන්වා දීම |

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුමසිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092607
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 05/2024

මගේ අංකය : MPA/HRD/ILO/Circular/01/2024
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2024.02.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන්

**<u>රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම</u>**

සේවා ස්ථාන සහයෝගීතාව තුළින් ශ්‍රී ලංකාව තුළ ඉහළ ගුණාත්මකභාවයකින් යුතු රාජ්‍ය සේවයක් ගොඩනැගීම හා මහජනතාව වෙත විශිෂ්ඨ සේවයක් සැපයීම අරමුණු කර ගනිමින් රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යෝජිත යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම උදෙසා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. දැනට පවතින නීතිමය ප්‍රතිපාදනයන්ට අනුව රජයේ සේවකයෙකුට තම අයිතිවාසිකම් කඩවීමකදී ඊට සහනයක් බලාපොරොත්තුවෙන් අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් පවතින නමුත්, සේවක කණ්ඩායම්හි අයිතිවාසිකම්වලට බලපෑමක් ඇතිවන අවස්ථාවකදී මෙන්ම, සේවකයෙකුගේ හෝ සේවක කණ්ඩායමකගේ ලබැදියාවන් (අභිරුචීන්) පිළිබඳ ඇතිවන ආරවුල් විසඳීම සඳහා විධිමත් ක්‍රමවේදයක් රාජ්‍ය සේවය තුළ දක්නට නොමැත. ඒ අනුව, රාජ්‍ය සේවකයින් සහ කළමනාකරණ යන දෙපාර්ශවය එක්ව කෙරෙන සාකච්ඡා මගින් පිළිගත හැකි විසඳුම්වලට එළඹීම සඳහා සමාජ කතිකාවත, උපදේශනය, සමථකරණය සහ බේරුම්කරණය යන ක්‍රමවේද මත පදනම් වූ රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා වූ යෝජිත යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට 2023.11.20 දිනැති අමප/23/2138/605/068 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී ඇත.

03. මෙම චක්‍රලේඛය මගින් යෝජිත නව යාන්ත්‍රණය සමස්ත රාජ්‍ය සේවය තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර මෙය සේවා ස්ථාන, ආංශික හා ජාතික මට්ටම යන ස්ථර තුනකින් ක්‍රියාත්මක වනු ඇත. මේ සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහ විශේෂඥ සහාය ඇතිව දැනට සෞඛ්‍ය හා ප්‍රවාහන අංශයන්හි සේවා ස්ථාන කිහිපයක සේවා ස්ථාන මට්ටමින් නියමු ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

04. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහාය ඇතිව මෙම අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් අනෙකුත් රාජ්‍ය ආයතනවල පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ.

(අ) රාජ්‍ය අයතනයන්හි සේවා ස්ථානවල **සේවා ස්ථාන සංසද**, ඒ ඒ අංශවල **ආංශික සංසද**, ජාතික මට්ටමේ **ජාතික රාජ්‍ය සංවාද සංසදය**, පළාත් මට්ටමින් **පළාත් සමථකරණ මණ්ඩල** නවය (09) සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන

අමාත්‍යාංශය යටතේ **ජාතික බේරුම්කරණ සංචිතය** පිහිටුවීම සඳහා අවශ්‍යවන නීතිමය ප්‍රතිපාදන හා ආයතනික රාමු සකස් කිරීම.

(ආ) රාජ්‍ය ආයතනයන්හි **සේවා ස්ථාන සංසද** හා ඒ ඒ අංශවල **ආංශික සංසද** ස්ථාපනය කිරීම.

(ඇ) ජාතික මට්ටමින් **ජාතික රාජ්‍ය සංවාද සංසදය** පිහිටුවීම.

(ඈ) පළාත් මට්ටමින් **පළාත් සමථකරණ මණ්ඩල** නවය (09) පිහිටුවීම.

(ඉ) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අනුබද්ධව ජාතික මට්ටමින් **ජාතික බේරුම්කරණ සංචිතය** පිහිටුවීම.

(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය ඇතිව රාජ්‍ය සේවයේ ඇති වන ආරවුල් පිළිබඳව **දත්ත පද්ධතියක්** පවත්වා ගෙන යාම.

(උ) ඉහත යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ විශේෂඥ සහාය ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් ලබා ගැනීම.

05. මෙම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම තුළින් රාජ්‍ය ආයතන තුළ පවතින සේවක ආරවුල් නිරාකරණය කර ගැනීමටත්, කළමනාකරණ, සේවක සහ වෘත්තීය සංගම්වල නියෝජිතයින් අතර සහයෝගීතාව වර්ධනය කරගැනීමටත්, සේවා ස්ථාන ප්‍රතිසංස්කරණ තුළින් රාජ්‍ය සේවයේ ඵලදායීතාව වර්ධනය කිරීම හා රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත්, ඒ තුළින් මහජනතාව වෙත විශිෂ්ඨ සේවයක් සැපයීමටත් අපේක්ෂා කෙරේ.

06. ඉහත 04 (අ) ඡේදයේ දැක්වෙන පරිදි අවශ්‍යවන නීතිමය ප්‍රතිපාදන හා ආයතනික රාමු හඳුන්වාදීම සම්පූර්ණ වන තෙක්, මෙම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට ඒ ඒ රාජ්‍ය ආයතනයන්හි ඉහළ කළමනාකරණය, සේවකයින් හා වෘත්තීය සංගම් නියෝජිතයින් ඇතුළු පාර්ශවකරුවන්ගේ එකඟතාව පරිදි සිදු කරනු ලැබේ. දැනට පවතින නෛතික ආරවුල් විසඳීමේ ක්‍රියාවලියට පරිබාහිරව පාර්ශවකරුවන් විසින් ඉහත සංසද ක්‍රියාත්මක කරනු ඇත.

07. ඒ අනුව, සමස්ත රාජ්‍ය සේවයටම මෙම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ මෙම චක්‍රලේඛයේ උපලේඛනයෙන් (ඇමුණුම 01) සවිස්තරව දැක්වේ. මෙම යාන්ත්‍රණය සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය මඟින් විමසිය හැකිය.




**ප්‍රදීප් යසරත්න**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකතනය : 011 2698462 විද්‍යුත් තැපැල : pubadarbitration@gmail.com


<u>පිටපත්</u>:

| | | |
|---|---|---|
| 01. | ජනාධිපති ලේකම් | - කරු අ.ක.ස. |
| 02. | අග්‍රාමාත්‍ය ලේකම් | - කරු අ.ක.ස. |
| 03. | අමාත්‍ය මණ්ඩල ලේකම් | - කරු අ.ක.ස. |
| 04. | විගණකාධිපති | - කරු අ.ක.ස. |

<u>උපලේඛනය</u>

# රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වාදීම සඳහා වූ මාර්ගෝපදේශය

## 1. හැඳින්වීම

රාජ්‍ය සේවය තුළ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොමැති වීම හේතුවෙන් නිරන්තරයෙන්ම පාහේ රාජ්‍ය අංශය තුළ වැඩවර්ජන දක්නට ලැබේ. මේ හේතුවෙන් ආර්ථිකයට අහිමිවන මිනිස් දින ගණන ඉතා ඉහළය. එමඟින් රට තුළ නිෂ්පාදන ක්‍රියාවලියට බාධා පැමිණීමත්, සපයනු ලබන සේවාව ද අකාර්යක්ෂමවීමත් හේතුවෙන් මහජනතාවට විශාල වශයෙන් පීඩාවක් ගෙනදේ. මෙයට පිළියමක් වශයෙන් හඳුන්වා දෙනු ලබන මෙම යාන්ත්‍රණය මඟින් රාජ්‍ය ආයතන තුළ සේවක සහ කළමනාකරණ දෙපාර්ශවය අතර සහයෝගීතාව වර්ධනය වීමත්, ඒ තුළින් දෙපාර්ශවය අතර ඇතිවන ආරවුල් විසඳා ගැනීම සඳහා ආයතනික මට්ටමින් සමාජ කතිකාවක් ගොඩනැගීමටත් අවකාශ සැලසේ. රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා හඳුන්වාදෙනු ලබන මෙම යාන්ත්‍රණය දැනට නියමු ව්‍යාපෘතියක් ලෙස සෞඛ්‍ය හා ප්‍රවාහන අංශවල සේවා ස්ථාන කිහිපයක ක්‍රියාත්මක වන අතර, එම සේවා ස්ථාන සංසද ක්‍රියාකාරිත්වයෙන් සේවකයන් හා කළමනාකරණය අතර සහයෝගීතාව වර්ධනය කිරීම පිණිස සාධනීය දායකත්වයක් සපයා ඇත. එම ව්‍යුහයම යොදා ගනිමින් අනෙකුත් රාජ්‍ය අයතනයන්හි සේවක ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා සේවා ස්ථාන සංසද පිහිටුවීමට මෙමඟින් මූලිකව අපේක්ෂා කෙරේ. තවද, සේවා ස්ථාන සංසද මඟින් විසඳුම් ලබා දිය නොහැකි ආරවුල් විසඳීම සඳහා ඒ ඒ අංශ නියෝජනය වන පරිදි ආංශික සංසද පිහිටුවීමත්, ජාතික මට්ටමේ රාජ්‍ය සේවයේ ආරවුල් විසඳීම සඳහා ජාතික රාජ්‍ය සංවාද සංසදය පිහිටුවීමත්, පළාත් මට්ටමින් පළාත් සමථකරණ මණ්ඩල නවය (09) පිහිටුවීමත් සහ ජාතික බේරුම්කරණ සංචිතයක් ඇති කරලීමත් මෙහි අනෙකුත් පියවරයන් වේ.

මෙහිදී දැනට පවතින නීතිමය ප්‍රතිපාදනයන්ට අනුව රජයේ සේවකයෙකුට තම අයිතිවාසිකම් කඩවීමකදී ඊට සහනයක් බලාපොරොත්තුවෙන් අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් පවතින නමුත්, සේවක කණ්ඩායම්හි අයිතිවාසිකම්වලට බලපෑමක් ඇතිවන අවස්ථාවකදී මෙන්ම සේවකයෙකුගේ හෝ සේවක කණ්ඩායමකගේ ලැබැදියාවන් (අභිරුචීන්) පිළිබඳ ඇතිවන ආරවුල් විසඳීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් රාජ්‍ය සේවය තුළ දක්නට නොමැත. මෙම හිඩැස පිරවීම සඳහා යෝජිත නව යාන්ත්‍රණය මඟින් රජයේ සේවකයින්ට තම හිමිකම් මෙන්ම ලැබැදියාවන් පිළිබඳ ඇතිවන ගැටළුවලට විසඳුම් ලබාගැනීමට අමතරව, සේවා ස්ථානය තුළදීම වෘත්තීය සංගම් සහ කළමනාකරණ පාර්ශවයන් අතර කෙරෙන සමාජ සංවාදය, උපදේශනය, සමථකරණය හෝ බේරුම්කරණය යන ක්‍රමවේද තුළින් ගැටළු විසඳා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

මෙම යාන්ත්‍රණය තුළින් රාජ්‍ය ආයතන තුළ පවතින සේවක ආරවුල් වැළැක්වීම සහ නිරාකරණය කරගැනීමට අමතරව කළමනාකරණ, සේවක සහ වෘත්තීය සංගම්වල නියෝජිතයින් අතර සහයෝගීතාව වර්ධනය කරගැනීමටත්, සේවා ස්ථාන ප්‍රතිසංස්කරණ තුළින් රාජ්‍ය සේවයේ ඵලදායීතාව වර්ධනය කිරීම මෙන්ම රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත් හා ඒ තුළින් මහජනතාව වෙත විශිෂ්ඨ සේවයක් සැපයීමටත් අපේක්ෂා කෙරේ.

මෙම යාන්ත්‍රණය සමස්ත රාජ්‍ය සේවය තුළම ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂඥ දැනුම, පුහුණුව සහ තාක්ෂණික සහාය සෑම අදියරකදීම ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 2. රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ ආරවුල් නිරාකරණය සඳහා යාන්ත්‍රණය

### 2.1 දැක්ම

මහජනතාවට ඉහළ ගුණාත්මකභාවයෙන් යුක්ත රාජ්‍ය සේවයක් සැපයීම සඳහා රාජ්‍ය සේවය තුළ ආරවුල් වැළැක්වීමේ හා ආරවුල් නිරාකරණය කිරීමේ ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

### 2.2 මෙහෙවර

සමාජ කතිකාවත සහ සේවා ස්ථාන සහයෝගීතාව යන සංකල්ප උපයෝගීකර ගනිමින් රාජ්‍ය සේවයේ ඵලදායීතාව, ගුණාත්මකභාවය සහ සේවක තෘප්තිය ඉහළ නැංවීම තුළින් මහජනතාව වෙත විශිෂ්ඨ සේවයක් සැපයීම.

### 2.3 අරමුණු

i. සමාජ කතිකාවත මත පදනම් වූ රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීමේ නව යාන්ත්‍රණය නියමු පදනමින් සේවා ස්ථාන කිහිපයක් තුළ මූලික වශයෙන් ක්‍රියාවට නැංවීමෙන් උගත් පාඩම් ගුරුකොට, රාජ්‍ය සේවකයින් සඳහා සේවා ස්ථාන සංසද, ආංශික සංසද, ජාතික රාජ්‍ය සංවාද සංසදය, පළාත් සමථකරණ මණ්ඩල සහ ජාතික බේරුම්කරණ සංචිතයක් පිහිටුවීම සඳහා අවශ්‍යවන නීතිමය ප්‍රතිපාදන හා ආයතනික රාමු සකස් කිරීම.

ii. දැනට ක්‍රියාත්මක වන නියමු සේවා ස්ථාන සංසද ශක්තිමත් කිරීම හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජයේ ආයතනවල කළමනාකරණ, සේවක සහ වෘත්තීය සංගම් නියෝජිතයින්ගෙන් සමන්විත සේවා ස්ථාන සංසද පිහිටුවීම.

iii. ඒ ඒ අංශ සඳහා වෘත්තීය සංගම්වල හා කළමනාකාරිත්වයේ නියෝජිතයින්ගෙන් සමන්විත ආංශික සංසද ස්ථාපනය කිරීම.

iv. ඒ ඒ ආංශික සභා නියෝජනය කරමින් වෘත්තීය සංගම්, අදාළ අමාත්‍යාංශ නියෝජිතයන් සහ ජාතික මට්ටමේ බලධාරීන්ගෙන් සමන්විත **ජාතික රාජ්‍ය සංවාද සංසදය** පිහිටුවීම.

v. 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත උපයෝගී කර ගනිමින් අධිකරණ අමාත්‍යවරයා විමසා රාජ්‍ය සේවයේ ආරවුල් සමථකරණය සඳහා පළාත් මට්ටමින් **පළාත් සමථකරණ මණ්ඩල** නවය (09) පිහිටුවීම.

vi. රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශයට අනුබද්ධව රාජ්‍ය සේවයේ ආරවුල් බේරුම්කරණය සඳහා ජාතික මට්ටමින් **ජාතික බේරුම්කරණ සංචිතයක්** පිහිටුවීම.

vii. රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය විසින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහය ලබාගෙන රාජ්‍ය සේවයේ ආරවුල් පිළිබඳව අංග සම්පූර්ණ **දත්ත පද්ධතියක්** සැකසීම සහ යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.

viii. මෙම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ විශේෂඥ සහය ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් ලබා ගැනීම.

## 3. රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම හා නිරාකරණය සඳහා වන යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන ආකාරය

රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම හා නිරාකරණය සඳහා වන යාන්ත්‍රණය සමස්ත රාජ්‍ය සේවය තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර මෙය සේවා ස්ථාන, ආංශික හා ජාතික මට්ටම යන ස්ථර තුනකින් ක්‍රියාත්මක වනු ඇත. තවද, ආරවුල් විසඳීම සඳහා සමථකරණ සහ බේරුම්කරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට පිළිවෙලින් පළාත් මට්ටමින් පළාත් සමථකරණ මණ්ඩල නවය (09) ක් හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අනුබද්ධව ජාතික මට්ටමින් ජාතික බේරුම්කරණ සංචිතය පිහිටුවනු ඇත.

### 3.1 සේවා ස්ථාන සංසද

රාජ්‍ය සේවයේ ආරවුල් වැළැක්වීම සහ නිරාකරණය සඳහා යෝජිත යාන්ත්‍රණයේ, බිම් මට්ටමින් නැතහොත් සේවා ස්ථාන මට්ටමින් පිහිටුවනු ලබන කමිටු ''සේවා ස්ථාන සංසද'' නම් වේ.

සේවා ස්ථාන සංසද පිහිටුවිය හැකි ස්ථාන සඳහා උදාහරණ:

i. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වූ ආරෝග්‍ය ශාලාවක්.
ii. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වූ පාසලක්.
iii. ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ වූ දුම්රිය සේවා ස්ථානයක්.

කළමනාකරණ සහ සේවක නියෝජිතයන්ගෙන් මෙම සේවා ස්ථාන සංසද සමන්විත වේ (සේවක නියෝජිතයන් ලෙස සේවකයින්ගේ එකඟතාව තුළින් වෘත්තීය සමිති නියෝජිතයින් හෝ සේවා කාණ්ඩ නියෝජනය වන පරිදි ස්වාධීන සේවකයින් ද පත්විය හැකිය). මේ සඳහා පත්වන කළමනාකරණ හා සේවක නියෝජිතයින්ගේ සංඛ්‍යාව ආයතනයේ සංයුතිය හෝ සේවක ප්‍රමාණය සලකා බලමින් 30-40 අතර පිරිසකට සීමා කිරීම යෝග්‍ය වේ (සවිස්තර අත්පොතක්[1] මඟින් සංසද ව්‍යවස්ථාවක ආකෘතියක් ඇතුළුව සේවා ස්ථාන සංසදයක් පිහිටුවීම, ක්‍රියාකාරකම් සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාපටිපාටීන් ඇතුළු සියලු අංගයන් පිළිබඳ විස්තර සපයයි).

සේවකයින්ට, වෘත්තීය සමිතිවලට, සේවක කණ්ඩායම්වලට, කළමනාකරුවන්ට තම අයිතිවාසිකම් සහ ලබැදියාවන් (අභිරුචීන්) පිළිබඳ ඇතිවන ආරවුල් වැළැක්වීම හා නිරාකරණය සම්බන්ධයෙන් සේවා ස්ථාන සංසද තුළින් උපදේශනය ලබා ගැනීමේ හැකියාව ඇත.

ආරම්භක සේවා සංසද සාමාජිකයින් විසින් පොදු එකඟතාව මත සකස් කර ගනු ලබන සේවා සංසද ව්‍යවස්ථාවක් මඟින් පාලනය සිදු කරනු ලබයි.

මෙහි මූලික ප්‍රවේශය වන්නේ සේවා ස්ථානයක සිටින සියලුම පාර්ශවයන් රැස්වී ගැටළු සාකච්ඡා කිරීම සහ විධිමත් අධිකරණමය විසඳුම් සෙවීමට හෝ වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමට පෙර, සංවාදය, උපදේශනය, මැදිහත්වීම, සමථකරණය සහ බේරුම්කරණය තුළින් සමාජ සංවාදය සහ සේවා ස්ථාන සහයෝගීතාව හරහා ගැටළු විසඳීමට උත්සාහ කිරීමයි.

සේවා ස්ථාන සංසද තුළින් ආයතනයන් හි ඵලදායිතාව ඉහළ නැංවීම, ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, රාජ්‍ය සේවා සැපයීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, කණ්ඩායමක් ලෙස ගැටළු විසඳීම සඳහා කළමනාකාරීත්වයට සහාය වීම, සේවක සුභසාධනය ඉහළ නැංවීම හා වැඩ පරිසරය වැඩිදියුණු කිරීම යනාදී කටයුතුවලට සහයෝගය ලැබේ.

[1] ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් සම්පාදිත මෙම අත්පොත භාෂාත්‍රයෙන්ම මුද්‍රණය කර ඇත. මෙහි ඊ-පිටපතක් මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශයෙන් ලබාගත හැකිය.

### 3.1.1 සේවා ස්ථාන සංසදවල විෂය පථය පහත පරිදි වේ.

i. සේවක ආරවුල් සම්බන්ධව සේවා ස්ථාන මට්ටමින් විසඳුම් ලබාදීම හෝ උපදෙස් ලබාදීම.
ii. සේවා ස්ථානයේ ක්‍රියාකාරිත්වය, කාර්යසාධනය පිළිබඳ දැනුම බෙදා ගැනීම.
iii. සේවා ස්ථානයේ ක්‍රියාවලීන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම, කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වැඩිදියුණු කිරීම.
iv. සේවාවන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
v. සේවකයන්ගේ චිත්ත ධෛර්ය වර්ධනය කිරීම සහ අත්දැකීම් බෙදා ගැනීම.
vi. නව තාක්ෂණය තුළින් විවිධ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සහ කාර්යයන් ප්‍රතිව්‍යුහගත කිරීම.
vii. අධ්‍යාපනය සහ පුහුණුව ලබාදීම.
viii. වැඩ සහ පෞද්ගලික ජීවිත අතර තුලනයන් පවත්වා ගැනීමට උපකාර කිරීම.
ix. සේවක සුභසාධනය ඉහළ නැංවීම.
x. ආංශික සභා විසින් යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් ක්‍රියාකිරීම.

සේවා ස්ථාන සංසද තුළ විසඳුම් නොලැබෙන අවස්ථාවලදී පළාත් සමථකරණ මණ්ඩලවලට යොමු කිරීමෙන් පාර්ශවයන් අතර සමථකරණ ක්‍රියාවලිය තුළින් කොන්දේසි මත එකඟතාවයකට පැමිණිය හැක. එසේ නොහැකි නම් ජාතික බේරුම්කරණ සංචිතයේ බේරුම්කරුවකු වෙත ගැටළුව යොමුකොට පාර්ශවයන් බැඳෙන තීරණයක් ලබාගත හැකිය. නොමැතිනම් සේවකයා හෝ කළමණාකරන පාර්ශවයන් අයත්වන අංශයේ ආංශික සංසදයට හෝ ඒ හරහා ජාතික රාජ්‍ය සංවාද සංසදයට ගැටළුව ඉදිරිපත් කළ හැකිය.

### 3.1.2 සේවා ස්ථාන සංසද පිහිටුවීමේ පියවරයන් පහත පරිදි වේ.

i. සේවා ස්ථාන සංසදයක් පිහිටුවීමට අදහස් කරන සේවා ස්ථානයේ ප්‍රධානියා හෝ සේවක නියෝජිතයින් විසින් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා මඟින් හෝ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය වෙතින් වැඩිදුර උපදෙස් ලබා ගැනීම.
ii. සේවා ස්ථාන සංසද පිහිටුවීම සම්බන්ධයෙන් මූලික වටයේ සාකච්ඡා, දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය සඳහා මෙන්ම ඒ ඒ ආයතන තුළ සේවා ස්ථාන සහයෝගිතා ඒකකයක් පිහිටුවීමට අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශයේ නිලධාරීන් හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නියෝජිතයන් සම්බන්ධ කර ගැනීම.
iii. සේවා ස්ථාන සහයෝගිතා ඒකකය මඟින් යෝජිත සේවා ස්ථානවල කළමනාකාරිත්වය, සේවක නියෝජිතයන් දැනුම්වත් කිරීම හා ඉන්පසු එම වැඩබිමේ නියෝජිතයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කිරීම.
iv. පත්කළ මෙහෙයුම් කමිටු මඟින් සේවා ස්ථාන තුළ අනෙකුත් සේවකයින් දැනුවත් කිරීම.
v. අදාළ සේවා ස්ථානය සඳහා ආදර්ශ සේවා ව්‍යවස්ථාවක් සකස් කිරීම, එය කළමනාකාරණ හා සේවක නියෝජිතයන් අතර සාකච්ඡාවට ලක් කිරීම හා ඒ සම්බන්ධව එකඟතාවයන්ට එළඹීම.

## 3.2 ආංශික සංසද

සේවා ස්ථාන සංසද තුළින් විසඳුම් ලබාගත නොහැකි ආරවුල් මෙන්ම ආංශික මට්ටමින් මතු වන ආරවුල් විසඳීම සඳහා පිහිටුවනු ලබන කමිටුව ආංශික සංසද නම් වේ. මෙම ආංශික සංසද මඟින් ආරවුල් සඳහා විසඳුම් ලබාදීමේදී එම විසඳුම් ක්‍රියාත්මක කළ හැකි රාජ්‍ය සේවා ප්‍රතිපත්ති හා පවතින නීති රෙගුලාසි සඳහා අනුකූල විසඳුම් වන බවට තහවුරු කර ගත යුතු වේ.

ආංශික සංසද පිහිටුවිය හැකි ස්ථාන සඳහා උදාහරණ:

i. සෞඛ්‍ය අංශය යටතේ වන ආංශික සංසදය
ii. අධ්‍යාපන අංශය යටතේ වන ආංශික සංසදය

සේවා ස්ථාන සංසද පිහිටුවීම සම්පූර්ණ නොවුවද ඕනෑම අංශයක් සඳහා ආංශික සංසදයක් පිහිටුවිය හැකිය. එහි කැඳවුම්කරු අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ. ආංශික සංසදය අදාළ අංශයේ කළමනාකාරිත්වය සහ වෘත්තීය සමිති නියෝජනය කරන සාමාජිකයින් 20-30 ක් පමණ පිරිසකගෙන් යුක්ත විය හැකිය.

### 3.2.1 ආංශික සංසදවල විෂය පථය පහත පරිදි වේ.

i. සේවා ස්ථාන සංසද තුළින් විසඳුම් ලබාදීමට අපොහොසත් වූ සේවක ආරවුල් විසඳීම සඳහා මැදිහත්වීම.
ii. අංශයේ සේවා ස්ථාන සංසද කිහිපයක් හෝ සේවක කණ්ඩායම් අතර ඇතිවන ආරවුල් වලට විසඳුම් ලබාදීම.
iii. අංශයේ සේවක කණ්ඩායම් තුළ විෂමතා සහ අසමානතා හේතුවෙන් සත්‍ය වශයෙන් හෝ අනුමාන වශයෙන් හෝ පැනනගින විවිධ ආරවුල් (පත්වීම්, උසස්වීම්, ස්ථාන මාරුවීම්, තනතුරින් පහත හෙළීම්, ශ්‍රේණිගත කිරීම්, තනතුරු විස්තර, පුහුණු අවස්ථා, රැකියා අවස්ථා, ත්‍යාග සහ අංශයේ ඒ හා සමාන කරුණු) සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ විසඳුම් යෝජනා කිරීම.
iv. අංශයට අදාළ පොදු ආරවුල් සම්බන්ධව සාකච්ඡා කිරීම සහ ඒ සම්බන්ධ එකඟතාවයන් හෝ නිර්දේශ ජාතික රාජ්‍ය සංවාද සංසදයට ඉදිරිපත් කිරීම.
v. සේවා ස්ථාන සංසද අධීක්ෂණය කිරීම.
vi. රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීමට උපදෙස් ලබාදීම.
vii. සේවා ස්ථාන සංසද විසින් ඉල්ලා සිටින අවස්ථාවල ප්‍රතිපත්ති සහ පරිචයන් පිළිබඳව උපදෙස් ලබා දීම.
viii. සේවා ස්ථාන සංසද විසින් නිර්මාණය කොට ක්‍රියාත්මක කරනු ලබන ප්‍රවේශයන් සහ පරිචයන් අධීක්ෂණය කිරීම සහ වඩා හොඳ පරිචයන් අංශයේ වෙනත් සේවා ස්ථානවල ප්‍රචලිත කිරීම.

## 3.3 ජාතික රාජ්‍ය සංවාද සංසදය

ආංශික සංසදවලින් විසඳිය නොහැකි ආරවුල් මෙන්ම රාජ්‍ය සේවකයින් තුළින් පැනනගින ජාතික මට්ටමේ පොදු ආරවුල් විසඳීම සඳහා පිහිටුවීමට නියමිත කමිටුව ජාතික රාජ්‍ය සංවාද සංසදය නම් වේ. මෙම සංසදයේ කැඳවුම්කරු වශයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා කටයුතු කරනු ලබන අතර මෙය පෞද්ගලික අංශයේ ක්‍රියාත්මක වන ජාතික කම්කරු උපදේශක සභාවේ ක්‍රියාකාරීත්වයට සමාන වේ.

ජාතික රාජ්‍ය සංවාද සංසදය රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වැනි ආයතන ද, ආයතන අධ්‍යක්ෂ ජනරාල් වැනි

ජාතික මට්ටමේ රාජ්‍ය නිලධාරීන් මෙන්ම අදාළ අමාත්‍යාංශ, ආංශික සංසද හා ජාතික මට්ටමේ ප්‍රධාන වෘත්තීය සමිතිවල නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

### 3.3.1 ජාතික රාජ්‍ය සංවාද සංසදයේ විෂය පථය පහත පරිදි වේ.

i. ආංශික සංසද මඟින් විසඳුම් ලබාදීමට අපොහොසත් වන ආරවුල් පිළිබඳ සාකච්ඡා කිරීම සහ ඒ සම්බන්ධ විසඳුම් යෝජනා කිරීම.
ii. සෘජුවම ජාතික මට්ටමින් රජයේ සේවකයින් විසින් ඉදිරිපත් කරන ආරවුල්වලට විසඳුම් යෝජනා කිරීම.

## 3.4 පළාත් සමථකරණ මණ්ඩල

පළාත් සමථකරණ මණ්ඩල පිහිටුවීමේ අරමුණ වන්නේ රාජ්‍ය සේවාවේ ආරාවුල් නිරාකරණය කිරීම සඳහා පළාත් මට්ටමින් සමථකරණ ක්‍රියාවලිය යොදාගැනීමයි. ආරවුලක මුල් අවස්ථාවේදී ම පාර්ශවයන් අතර කෙරෙන සංවාදයෙන් ආරවුල් විසඳාගත නොහැකි වන්නේ නම්, මැදිහත්වීම හෙවත් සමථකරණය සඳහා සලකා බැලිය හැකිය. පළාත් මට්ටමින් විශේෂ සමථ මණ්ඩල ස්ථාපනය කිරීම සඳහා 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත උපයෝගී කර ගනිමින් හා අධිකරණ අමාත්‍යවරයා විමසා මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

## 3.5 ජාතික බේරුම්කරණ සංචිතය

ජාතික බේරුම්කරණ සංචිතය යනු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අනුබද්ධ ස්වාධීන බේරුම්කරුවන්ගෙන් සමන්විත ජාතික මට්ටමින් පිහිටුවනු ලබන සංචිතයකි. බේරුම්කරණය සඳහා ඉදිරිපත් කරන ලද ආරවුල් සම්බන්ධයෙන් බේරුම්කරු විසින් අවසන් තීරණයක් ගනු ලබන අතර අත්‍යාවශ්‍ය සේවා සම්බන්ධයෙන් අදාළ විෂය හෝ කාර්යය පවරා ඇති අමාත්‍යවරයා විසින් අනිවාර්ය බේරුම්කරණය සඳහා පාර්ශව යොමු කරනු ලබයි.

මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබයි.